සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

ගිණුම්කරණය - I | 33 S I

කාලය: පැය දෙකයි.

විභාග අංකය: ....

01. ආයතනයක මූල්‍ය **ගිණුම්කරණය** සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය, ප්‍රකාශ නිවැරදි වේද?

A ගිණුම්කරණ ඒකකයක ඓතිහාසික හා පුරෝකථන තොරතුරු ගිණුම්කරණ යෙදවුම් ලෙස භාවිතා කරයි.

B ඇල්ම ඇති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි.

C කාලච්ඡේදයක් සඳහා තොරතුරු ඉදිරිපත් කරයි.

1. C පමණි. 2. A හා B පමණි. 3. A හා C පමණි.
4. B හා C පමණි. 5. A, B හා C යන සියල්ලම.

02. සීමිත පොදු සමාගමක 2022.03.31 දිනට පිළියෙල කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු වගකීමෙන් එළඹෙන වසරේ ගෙවීමට නියමිත පොලී රහිත වගකීම, ජංගම වගකීම් ලෙස වර්ග කිරීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණය සංකල්පයද?

1. යථාරූපී 2. අඛණ්ඩ පැවැත්ම 3. සංගතතා 4. උපචිත 5. ගැලපුම්

03. තොරතුරු භාවිතා කරන පාර්ශවවල තීරණ වෙනස් කිරීමට මූල්‍ය ප්‍රකාශන තොරතුරුවලට හැකියාවක් ඇත්නම් එම මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු පහත කුමන **ගුණාංගයෙන්** යුක්ත වේද?

1. කාලීන බව 2. සත්‍යාපනය කළ හැකි බව 3. සන්සන්දනාත්මක බව
4. විශ්වානීය නියෝජනය 5. අදාළ බව

- ප්‍රශ්න අංක 4, 5, 6 හා 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

කල්පනී ව්‍යාපාරයේ 2022 මාර්තු මාසයේ දී පහත ගණුදෙනු සිදු විය.

2022.03.10 සදීප පැෂන් වෙතින් එකක් රු.800 බැගින් ළමා ඇඳුම් 110ක් ණයට මිලදී ගැනීම.
2022.03.12 සදීප පැෂන් වෙතින් ණයට මිලදී ගත් ළමා ඇඳුම් 10ක් ආපසු යැවීම.

2022.03.18 සදීප පැෂන් වෙතින් මිලදී ගත් ළමා ඇඳුම් 50ක් එකක් රු.1,200 බැගින් අත්පිට මුදලට විකිණීම.

2022.03.25 10%ක වට්ටමකට යටත්ව සදීප පැෂන් වෙත චෙක්පතක් නිකුත්කර ණය පියවීම.

2022.03.28 සදීප පැෂන් වෙත නිකුත් කළ චෙක්පත අගරු වී ඇති බව දැනුම් දීම.

04. සදීප පැෂන් ව්‍යාපාරය සමඟ සිදුකල ඉහත ගණුදෙනු ඒවා සිදු වූ දින අනුපිළිවෙල අනුව කල්පනී ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට භාවිතා කළ මූලාශ්‍ර ලේඛණ වන්නේ,

1. ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය, ජ'නල වවුචරය.
2. ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය.
3. ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය, ලදුපත.
4. ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය, ලදුපත.
5. ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය, ජ'නල වවුචරය.

05. කල්පනී ව්‍යාපාරය සමඟ සිදුකල ඉහත ගණුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙල අනුව **සදීප පැෂන්** ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට භාවිතා කළ මූලික සටහන් පොත් දින අනුපිළිවෙලින්.

1. විකුණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, පොදු ජ'නලය.
2. ගැණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ආපසු ගෙවුම් ජ'නලය, පොසු ජ'නලය.
3. විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, පොදු ජ'නලය.
4. ගැණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ආපසු ගෙවුම් ජ'නලය.
5. ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය.

06. 2022.03.28 දින සදීප පැෂන් වෙත නිකුත් කළ චෙක්පත අගරු වීම **කල්පනී ව්‍යාපාරයේ** පොත්වල නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන කුමක්ද?

1.	මුදල් ගිණුම	හර 80,000
	ණයහිමි පාලන ගිණුම	හර 80,000
2.	ණය ගිණුම	හර 72,000
	ණයගැති පාලන ගිණුම	හර 80,000
3.	ණයගැති පාලන ගිණුම	හර 72,000
	මුදල් ගිණුම	හර 80,000
4.	මුදල් ගිණුම	හර 72,000
	ලද වට්ටම් ගිණුම	හර 8,000
	ණය හිමි පාලන ගිණුම	බැර 80,000
5.	ණයගැති පාලන ගිණුම	හර 8,000
	මුදල් ගිණුම	බැර 72,000
	දුන් වට්ටම් ගිණුම	බැර 8,000

07. කල්පනී ව්‍යාපාරයේ 2022.03.10 සිට 2022.03.28 දක්වා සිදු වූ **ගණුදෙනු වල ශුද්ධ බලපෑම** නිරූපණය කරනු ලබන ගණුදෙනු සමීකරණය කුමක්ද?

	වත්කම්	=	වගකීම්	+	හිමිකම්
1.	120,000		0		20,000
2.	28,000		0		28,000
3.	100,000		72,000		28,000
4.	100,000		80,000		20,000
5.	108,000		88,000		20,000

08. චලනිගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනට මුදල් ගිණුමේ රු.80000ක අයිරාවක් පැවතුණි. නමුත් මාර්තු මාසය සඳහා එවන ලද බැංකු ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ පැවති හර ශේෂය මීට වෙනස් විය. වෙනසට හේතු වීමේදී පහත කරුණු අනාවරණය විය.

- තැම්පත් කළත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම රු. 120,000ක් වූ අතර නිකුත් කළත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු.110,000ක් වීම.
- බැංකුව විසින් වෙනත් ගිණුම් හිමියෙකුගේ ගිණුමට හර කළ යුතු රු.20,000ක් වැරදීමෙන් ව්‍යාපාරයේ ගිණුමට කර කර තිබීම.
- බැංකුව අයකර තිබූ රු.5,000ක බැංකු ගාස්තු ව්‍යාපාරයේ පොත්වල සටහන් වී නොතිබීම.

2022 මාර්තු මාසය සඳහා එවන ලද බැංකු ප්‍රකාශනයේ මාර්තු 31 දිනට **පැවති අයිරාව** කුමක්ද?

1. රු. 45,000 2. රු.55,000 3. රු.75,000 4. රු.85,000 5. රු.115,000

9, 10, හා 11 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

රු.500,000ක් මුදලක් ආයෝජනය කරමින් 2022.03.01 දින ආරම්භ කළ ව්‍යාපාරයක් එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2022 මාර්තු මාසයේ සිදු වූ ගණුදෙනු හා අනෙකුත් විස්තර පහත වේ.

- රු.400,000කට වෙළඳ භාණ්ඩ අත්පිට මුදලට මිලදී ගන්නා ලදී.
- එම භාණ්ඩ වලින් කොටස් රු.200,000කට අත්පිට මුදලට රු.175,000කට ණයටද විකුණුම් සිදුකර ඇත.
- එම භාණ්ඩවලින් රු.15,000ක හා විකුණුම් වටිනාකම සහිත භාණ්ඩ ගණුදෙනුකරු විසින් ආපසු එවා ඇත.
- ණයගැතියන්ගෙන් රු.100,000ක් මුදල් ලැබී තිබුණි.
- ඉහත ගැනුම්, විකුණුම් හා ආපසු එවුම් වටිනාකම් සඳහන්ව ඇත්තේ 12%ක VAT රහිත මිලටය.
- මෙම ව්‍යාපාරයේ භාණ්ඩ අලෙවි කරනුයේ පිරිවැයට 25%ක ලාභාන්තියක් සහිතවය.

09. 2022.03.31 දිනෙන් අවසන් **මාසය සඳහා දළ ලාභය** හා 2022.03.31 දිනට **අවසන් තොගය වටිනාකම** කොපමණද?

	දළ ලාභය (රු)	අවසන් තොගයේ වටිනාකම (රු)
1.	72,000	112,000
2.	72,000	125,440
3.	80,640	100,000
4.	80,640	108,640
5.	120,000	125,440

10. 2022.03.31 දිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය හා VAT පාලන ගිණුමේ ශේෂය කොපමණද?

	මුදල් (රු)	VAT පාලන ගිණුම (රු)
1.	46,000	3000 හර ශේෂය
2.	320,000	3000 බැර ශේෂය
3.	376,000	4800 හර ශේෂය
4.	376,000	4800 බැර ශේෂය
5.	400,000	2700 හර ශේෂය

11. 2022.03.31 දිනට **හිමිකම හා ණයගැති පාලන ගිණුමේ ශේෂය** කොපමණද?

	හිමිකම (රු)	ණයගැති පාලන ගිණුමේ ශේෂය (රු)
1.	495,200	6,000
2.	572,000	79,200
3.	572,000	96,000
4.	580,640	96,000
5.	620,000	79,200

12. 2022.01.01 දින භාණ්ඩයක් නිෂ්පාදනය කර අලෙවි කිරීම සඳහා ආරම්භ කළ ව්‍යාපාරයක 2022 ජනවාරි මාසයට අදාළව පොත්වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

- පරිභෝජන ද්‍රව්‍ය පිරිවැය රු.120,000.
- නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය රු.80,000.
- මාසයේ මුළු විකුණුම් වටිනාකම රු.500,000.
- 2022.01.31 දිනට නොනිමි තොගයේ වටිනාකම හා නිමි තොග වටිනාකම පිළිවෙලින් රු.20,000ක් හා රු.60,000ක් විය.

- ව්‍යාපාරය නිෂ්පාදන පිරිවැය මත නොනිමි තොග අගය කරයි.
- ව්‍යාපාරය භාණ්ඩ අලෙවි කරනුයේ පිරිවැයට 25%ක ලාභාන්තියක් සහිතවය.

2022 ජනවාරි මාසය සඳහා **ප්‍රාථමික පිරිවැය** කොපමණද?

1. රු.400,000 2. රු.460,000 3. රු.48,000 4. රු.52,000 5. රු. 560,000

13. යහපත සුභසාධක සංගමයේ 2021.04.01 දිනට හිඟ සාමාජික මුදල් රු.12,000ක් වූ අතර ඉදිරියට ලද සාමාජික මුදල් රු.9,000කි. 2021/2022 වර්ෂය තුළදී ලැබුණු සාමාජික මුදල් පහත පරිදි වේ.

- 2020/2021 වර්ෂය සඳහා රු.8,000
- 2021/2022 වර්ෂය සඳහා රු.184,000
- 2022/2023 වර්ෂය සඳහා රු.6,000

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී තවදුරටත් වර්ෂය ආරම්භයට සාමාජික මුදල් හිඟ අයගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී. 2022.03.31 දිනට හිඟ සාමාජික මුදල රු.7000කි.

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **හඳුනාගත් සාමාජික මුදල් ආදායම** කොපමණද?

1. රු. 196,000 2. රු.198,000 3. රු. 200,000 4. රු. 204,000 5. රු.206,000

14. පහත කුමන ප්‍රකාශන හවුල් ව්‍යාපාරයකට අදාළව නිවැරදි වේද?

A 1890 හවුල් ආඥා පනතේ 42 වගන්තිය අනුව හවුල්කරුවන් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා 5%ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.

B 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියට අනුව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂික පොලියක් ලබාගැනීමට හිමිකම් ලබයි.

C හවුල් ව්‍යාපාරයේ වියදම් හවුල්කරුවන්ගේ පුද්ගලික මුදලින් ගෙවා ඇති විට එය ප්‍රතිපූර්ණය කිරීමට 1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තියෙන් හවුල්කරුවන් හිමිකම් ලබයි.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි
4. A හා C පමණි 5. B හා C පමණි.

- අංක **15 හා 16** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පහත තොරතුරු භාවිත කරන්න.

ලාභාලාභ 3:2 අනුපාතයට බෙදා ගනිමින් රමණි හා කමණි විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයට 2021.04.01 දින තෙරුණි හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. ඇය රු.400,000ක් ප්‍රාග්ධනය ලෙස ගෙන එන ලදී. මෙදිනට ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළ ගලපන ලදී. රමණි, කමණි, සහ තෙරුණි හවුල් ව්‍යාපාර ගිවිසුමේ එකඟතා පහත පරිදි වේ.

- රමණි, කමනි හා තෙරුණි පිළිවෙලින් ලාභාලාභ 3:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.
- කමණිට රු 360,000ක වාර්ෂික වැටුපක හිමිකම ලබයි.

පහත තොරතුරුද දී ඇත.

	ප්‍රාග්ධන ගිණුම් '000'		ජංගම ගිණුම් '000'	
	2022.03.31 දිනට,	2021.03.31 දිනට	2022.03.31 දිනට,	2021.03.31 දිනට
රමණි	630	600	440	300
කමණි	420	400	500	40
තෙරුණි	350	-	60	-

වර්ෂය තුළදී රමණි හා කමණි අතිරේක ප්‍රාග්ධනයක් සපයා නොමැත. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් කරුවන්ගේ භාණ්ඩ ගැනිලි රමණි හා කමණි පිළිවෙලින් රු.40,000ක් හා රු.20,000ක් විය.

15. 2021.04.01 දින තෙරුණි බඳවා ගැනීම නිසා ඇස්තමේන්තු ගත **කීර්තිනාම වටිනාකම** හා 2022.03.31 දිනට හවුල් **ව්‍යාපාරයේ හිමිකම** කොපමණද?

කීර්තිනාමය ('000')		හිමිකම (රු'000')
1.	100	1250
2.	250	1400
3.	300	2400
4.	350	1000
5.	400	2400

16. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ **වර්ෂය සඳහා ලාභය** සහ **කමණිට බෙදාහරින ලද මුළු ලාභය** කොපමණද?

වර්ෂය සඳහා ලාභය (රු'000')		කමණිට බෙදාහරින ලද මුළු ලාභය (රු'000')
1.	300	120
2.	360	120
3.	360	480
4.	720	120
5.	720	480

17. ආයතනයක තොගය A හා B යන අයිතම දෙකකින් සමන්විත වේ. 2022.03.31 දිනට තොග ශේෂයන්ට අදාලව පහත තොරතුරු ලබා දී ඇත.

තොග අයිතමය	භෞතික ශේෂය (ඒකක)	පොත්වලට අනුව ශේෂය (ඒකක)	ඒකකයක පිරිවැය (රු)	ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල (රු)	ඒකකයක අපේක්ෂිත විකුණුම් වියදම් (රු)
A	1000	1000	40	55	10
B	500	600	60	55	5

අයිතම ක්‍රමය යටතේ තොග අගය කරන්නේ නම් 2022.03.31 දිනට තොගයේ වටිනාකම කොපමණද?

1. රු.65,000 2. රු. 70,000 3. රු. 75,000 4. රු.76,000 5. රු. 82,500

18. සීමිත රොෂාන් පොදු සමාගමේ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022.06.15 දින අධ්‍යක්ෂකවරු අනුමත කරන ලදී. 2022.03.31 දින සිට 2022.06.15 දින දක්වා කාලය තුළදී පහත සිදුවීම් සමාගමේ සිදුවිය

A 2022.04.10 දින ව්‍යාපාරයේ ඇති වූ හදිසි ගින්නකින් 2022.03.31 දිනට පැවති තොගය විනාශ වීම.

B 2022.05.10 දින, 2022.03.31 දිනට පැවති තොගය රු.1000කින් අධිගනනයක් වී ඇති බව අනාවරණය වීම.

C 2022.04.05 දින ණයට භාණ්ඩ මිලදී ගත් ණයගැතියෙකු බුන්වත් වූ බව 2022.05.20 දින අධිකරණය විසින් ප්‍රකාශ කිරීම.

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල ඉහත කුමන සිදුවීම්/ සිදුවීම **ගලපන සිද්ධීන්** ලෙස සලකණු ලබයිද?

1. A පමණි. 2. B පමණි. 3. C පමණි 4. A හා B පමණි 5. B හා C පමණි.

19. LKAS 08 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් හා වැරදි) ප්‍රමිතියට අනුව පහත කුමන අවස්ථා ගිණුම්කරණ **ඇස්තමේන්තු වෙනස්වීමක්** ලෙස සලකනු ලබන්නේද?

A තොග අගය කිරීමට යොදා ගනු ලබනපිරිවැය සූත්‍රය පෙර පිවිසි පෙර පිට (F1F0) ක්‍රමයේ සිට භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට වෙනස් කිරීම.

B මෝටර් රථවල අපේක්ෂිත ඵලදායී ජීවකාලය වසර 10 සිට 8 දක්වා වෙනස් වීම.

C විකුණුම් මත වගකීම් සහතික වෙන් කිරීමේ ප්‍රතිශතය ඉහළ දැමීම.

1. A පමණි. 2. B පමණි. 3. A හා B පමණි
4. B හා C පමණි 5. A, B හා C යන සියල්ලමය.

20. 2018.04.01 දින සීමිත විහාරා පොදු සමාගම නිෂ්පාදන කටයුතු සඳහා රු.2,800,000ක් පිරිවැය වූ යන්ත්‍රයක් මිලදී ගෙන ඇති අතර එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය, සුන්බුන් අගය පිළිවෙලින් වසර 10 සහ රු.400,000ක් විය. 2021.04.01 දින රු.625,000ක් වැය කර යන්ත්‍රය නවීකරණය කරන ලදී. මේ හේතුවෙන් යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය තවත් වසර දෙකකින් වැඩිවන බවත්, සුන්බුන් අගය රු.100,000කින් වැඩිවන බවත්, කළමනාකරණය විසින් ඇස්තමේන්තු කරන ලදී. LKAS 16 (දේපළ පිරියත හා උපකරණ) ප්‍රමිතියට අනුව 2022.03.31 දිනෙන් අවසන් **වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය** ප්‍රමාණය කොපමණද?

1. රු.183,750 2. රු. 245,000 3. 256,000 4. රු.325,000 5. රු. 405,000

21. පහත ගණුදෙනු අතුරින් සීමිත පොදු සමාගමක **හිමිකම අඩුවීමට** හේතුවන ප්‍රකාශය/ ප්‍රකාශ කුමක්ද?

A හිමිකම් නිකුතුවක් කළ අතර, එය සියලු කොටස්කරුවන් මිලදී ගෙන තිබීම.

B සංචිත ප්‍රාග්ධනීත කිරීම.

C සාමාන්‍ය කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීම.

D සංචිතවලට මාරු කිරීම.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි
4. B හා C පමණි. 5. B, C හා D පමණි.

22. මූල්‍ය වර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවක් ගොඩනැගීමට හේතුවන පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේද?

A ගිණුම්කරණ ප්‍රමිත සැකසීම සඳහා පදනම සැපයීම.

B මූල්‍ය ප්‍රකාශනය භාවිත කරන්නට ඒවා හොඳින් අවබෝධ කරගැනීමේ හැකියාව ලබාදීම.

C මූල්‍ය තොරතුරුවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා න්‍යායාත්මක පදනමක් සැකසීම.

D අදාළ ගිණුම්කරණ ප්‍රමිති නොමැති අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමට මග පෙන්වීම.

1. A හා B පමණි. 2. C හා D පමණි. 3. A, B හා C පමණි.
4. A, C හා D පමණි. 5. A, B, C හා D සියල්ලම

23. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සීමිත මහේල පොදු සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධ පහත තොරතුරු අදාළ වේ.

	රු.'000'
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	6000
පොලී වියදම (උපචිත පොලිය රු.200,000)	300
දේපළ පිරියත හා උපකරණ ක්ෂය	1200
ආදායම් බදු වියදම් (උපචිත ආදායම් බදු රු.400,000)	600
තොග අඩු වීම	500
වෙළඳ ගෙවිය යුතු දෑ වැඩිවීම	1000

ඉහත තොරතුරු අනුව 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ බදු පෙර ලාභය කොපමණද?

1. රු.3,000,000 2. රු.3,300,000 3. රු. 3,800,000 4. රු. 4,300,000 5. රු. 6,800,000

24. 2022.03.31 දිනට සිල්ලර වෙළඳ ව්‍යාපාරයක ක්ෂණික අනුපාතය 2:1ක් විය. අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී මෙම **අනුපාතය අඩුවීමට** බලපාන්නේ පහත කුමන ගණුදෙනුවෙන්ද?

1. ණයට විකුණූ භාණ්ඩ තොගයක් ආපසු එවීම.
2. භාණ්ඩ විකුණුමක් සඳහා අත්තිකාරමක් ලැබීම.
3. බැංකුවකින් දිගු කාලීන ණයක් ලබා ගැනීම.
4. මෝටර් රථයක් මුදලට විකිණීම.
5. ලාභයක් සහිතව භාණ්ඩ තොගයක් ණයට විකිණීම.

25. පහත සඳහන් තොරතුරු සීමිත පොදු සමාගමකට අදාල වේ.

		2022.03.31 දිනට (රු.)	2021.03.31 දිනට (රු.)
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රු.	800,000	800,000
පොදු සංචිතය	රු.	1,000,000	600,000
රඳවාගත් ඉපයීම්	රු.	600,000	800,000
2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා :			
සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ අතුරු ලාභාංශය	රු.	800,000	
බැංකු ණය මත පොලී	රු.	200,000	
2022.03.31 දිනට මුළු වත්කම්	රු.	4,000,000	

සමාගමේ මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය කොපමණද?

1. 10% 2. 15% 3. 20% 4. 25% 5. 30%

26. නිෂ්පාදන ආයතනයක් විසින් දරන ලද පහත කුමන පිරිවැය අයිතම **ඍජු පිරිවැය** ලෙස වර්ග කෙරේද?

A අමු ද්‍රව්‍ය කම්හලට ගෙන ඒම සඳහා දැරූ ප්‍රවාහන පිරිවැය.
B නිෂ්පාදන සුපරීක්ෂකට ගෙවූ මාසික වේතනය.
C නිෂ්පාදනය කරන ඒකක ගණන මත සේවකයන්ට ගෙවූ වේතන.
D කම්හල් ගොඩනැගිලි කුළිය.

1. A හා C පමණි. 2. B හා D පමණි. 3. A හා D පමණි.
4. A, B හා D පමණි. 5. A, C හා D පමණි.

27. ආර්ථික ඇනවුම් ප්‍රමාණය (EOQ) ගණනය කිරීමේදී පදනම් කරගන්නා **උපකල්පනයක් නොවන්නේ** පහත සඳහන් ඒවායින් කුමක්ද?

1. තොග ඇනවුම් පිරිවැය නිශ්චිත බව.
2. තොග ඇනවුම් කරන ප්‍රමාණය එකවර ලැබෙන බව.
3. තොග ඒකකයක මිල නිශ්චිත බව.
4. අවම තොග මට්ටම ශූන්‍ය මට්ටමේ පවතින බව.
5. වාර්ෂික තොග පරිභෝජනය නියත වශයෙන් වෙනස් වන බව.

28. ටයර් නිෂ්පාදන පොදු සමාගමක 2022 මාර්තු මාසය සඳහා වැටුප් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

විස්තරය	නිෂ්පාදන සේවකයින් රු'000'	නිෂ්. සුපරීක්ෂකවරු රු'000'	නිෂ්. කළමණාකරුවන් රු. '000'
මූලික වැටුප	2800	900	500
දිරි දීමනා (කැලි අනුපාතය පදනම්ව)	700	-	-
ගමන් වියදම් දීමනා	—	100	50
දළ වැටුප	3500	1000	550
සේවක අඩු කිරීම් (EPF 10%)	(280)	(90)	(50)
ශුද්ධ වැටුප	3220	910	500
සමාගමේ දායකයත්:			
EPF (15%)	420	135	75
ETF (3%)	84	27	15

- **දිරිදීමනා විශේෂ ටයර් වර්ගයක් නිෂ්පාදනය කිරීම සඳහා ලද ඇණවුමක් සම්පූර්ණ කිරීම හා බැඳේ.**
  2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා **ඍජු වේතන** හා සේවකයන්ට අදාල **නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය** කොපමණද?

	ඍජු වේතන (රු'000')	සේවකයන්ට අදාළ නිෂ්පාදන පො.කා.පි. (රු'000')
1.	2800	1400
2.	3304	1652
3.	3500	1550
4.	3724	1662
5.	4004	1802

29. පහත තොරතුරු සමාගමක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.
ඒකකයත විචල්‍ය පිරිවැය රු.300, දායක විකුණුම් අනුපාතය 40% ඒකක විචල්‍ය පිරිවැය නොවෙනස්ව තිබිය දී එහි විකුණුම් මිල වැඩි කිරීමෙන් දායක විකුණුම් අනුපාතය 60% දක්වා වැඩි කිරීමට සමාගම බලාපොරොත්තු වේ.

භාණ්ඩයේ නව **විකුණුම් මිල** කොපමණද?

1. රු.420 2. රු.480 3. රු.500 4. රු.550 5. රු.750

30. ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය රු.450,000කි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී පහත කුමන සාධක ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය '**වැඩිවීමට**' බලපායිද?

A වට්ටම් අනුපාතය අඩුවීම.
B ව්‍යාපෘති වර්තාව පිළියෙල කිරීමේ පිරිවැය අඩුවීම.
C ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම් අඩුවීම.
D සුන්බුන් අගය වැඩිවීම.

1. A හා B පමණි. 2. A හා D පමණි. 3. B හා D පමණි.
4. A, B හා D පමණි. 5. B, C හා D පමණි.

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත කාර්යන් කළමනාකරණ ගිණුම්කරණයේ විෂය පථය තුළට ඇතුළත් වන්නේ ද යන්න සඳහන් කරන්න.

	කාර්යය	ඔව්/ නැත.
A	පොදු කාර්යය පිරිවැය පිළිබඳ විභජන පත්‍රිකා පිළියෙල කිරීම.	....
B	පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.	....
C	ගිණුම්කරන අනුපාත මත ආයතනයක ලාභදායකත්වය විශ්ලේෂණය කිරීම.	....
D	දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම.	....

32. එකතුකල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති යෝගානන්ද ව්‍යාපාරය 15% VAT සහිතව රු.92,000කට අත්පිට මුදලට භාණ්ඩ මිලදී ගෙන, එදිනම එම භාණ්ඩ සියල්ලම 20%ක ලාභාන්තිකයක් ලබා ගෙන අත්පිට මුදලට විකුණන ලදී. පහත ආකෘතිය භාවිත කරමින් ගිණුම්කරණ සමීකරණය තුළ මෙම ගණුදෙනු වල ශුද්ධ බලපෑම පෙන්වන්න.

වත්කම් : රු. .... = වගකීම් : රු. .... + හිමිකම් :රු. ....

33. මධුර සහල් ඇඹරුම් හලේ සිදුවූ පහත එක් එක් ගණුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන **මූලාශ්‍ර ලේඛනය** නම් කරන්න.

ගණුදෙනුව		මූලාශ්‍ර ලේඛනය
A	ගොවීන්ගෙන් අත්පිට මුදලට වී මිලදී ගැනීම .	....
B	හාල් සැකසීමේ යාන්ත්‍රණයක් ණයට මිලදී ගැනීම.	....
C	තොග වෙලෙන්දාට සහල් ණයට විකිණීම.	....
D	සත්ව ආහාර සඳහා කැඩුනු හාල් තොග අත්පිට මුදලට විකිණීම.	....

34. නිෂ්පාදන ආයතනයක ණයහිමි පාලන ගිණුමේ ශේෂය වැඩි වීමට, අඩුවීමට හෝ වෙනස් නොවීමට පහත ගණුදෙනු හා වැරදි හේතු වන්නේද යන්න සඳහන් කරන්න.

ගණුදෙනුව		අඩුවේ/ වැඩිවේ/ වෙනස් නොවේ
A	භාවිත කිරීම සඳහා යාන්ත්‍රයක් ණයට ගැනීම.	....
B	ණයට මිලදී ගත් අමුද්‍රව්‍ය වලින් කොටසක් ආපසු යැවීම.	....
C	ණය හිමියකුට වට්ටමකට යටත්ව නිකුත්කල චෙක්පතක් අගරුවීම.	....
D	මුදල් ගෙවීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව අඩුවෙන් සටහන් වීම .	....

35. පහත එක් එක් අයිතමය හඳුනාගනු ලබන්නෙ කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයෙහි ද යන්න පැහැදිලි කරන්න

අයිතමය		මූලිකාංගය
A	බොල්ණය ආපසු ලැබීම.	....
B	කාර්යාල උපකරණ විකුණුම් මත අලාභය.	....
C	ගෙවූ අතුරු ලාභාංශ.	....
D	වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන. .	....

36. එකතු කළ අගය මත බදු VAT සඳහා ලියාපදිංචි වී ඇති නිෂ්පාදන සමාගමක් 2021.04.01 දින 15%ක VAT සහිතව රු.2,760,000කට නව යන්ත්‍රයක් ණයට මිලදී ගෙන, රු.150,000ක් වැයකර යන්ත්‍රය ස්ථාපනය කර 2021.07.01 දින නිෂ්පාදන කටයුතු සිදු කරන ලදී.

පහත සඳහන් දෑ ලියා දක්වන්න.

(අ) යන්ත්‍රයේ පිරිවැය රු. ....

(ආ) යන්ත්‍රය මිලදී ගැනීමට අදාල ජ'නල් සටහනඃ

....

....

....

- **අංක 37 හා 38 ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සිතුම්, පැතුම් හා විකුම් විසින් ලාභාලාභ පිළිවෙලින් 3:2:1 අනුපාතයට බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2022.03.31දින විකුම් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා අතර ඔහුගේ හිමිකම ණය ගිණුමට මාරු කිරීමට එකග වන ලදී එදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.600,000කට තක්සේරු කර හවුකරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපීමට තීරණය විය. සිතුම් හා පැතුම් ලාභාලාභ සමානව බෙදා ගනිමින් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යන ලදී. අතිරේක තොරතුරු පහත දී ඇත.

	සිතුම් (රු'000')	පැතුම් (රු'000')	විකුම් (රු.'000')
2021.04.01 දිනට ජංගම ශේෂ	100	80	50
2022.03.31 දිනට ජංගම ශේෂ	310	260	200
හවුල් වේතන	120	120	120
ප්‍රාග්ධන පොලී	60	40	20

(ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂිකව 10% බැගින්)

වර්ෂය සඳහා විකුම්ට බෙදාහරින ලද මුළු ලාභය රු.150,000කි. වර්ෂය තුළ හවුල් කරුවන් අතිරේක ප්‍රාග්ධන යෙදීමක් හා ගැනිලි සිදු කර නොමැත.

37. සිතුම්, පැතුම්, හා විකුම් හවුල් ව්‍යාපාරය සඳහා පහත දෑ හඳුනාගනිමු.

(අ) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ....

(ආ) 2022.03.31 දිනට සිතුම්ගේ හා පැතුම්ගේ හිමිකම:

සිතුම් : රු. .... පැතුම් : රු. ....

38. විකුම්ට විසර්ජනය කරන ලද මුළු ලාභය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල සටහන හා විකුම්ගේ ණයගිණුමට මාරු කළ මුදල සඳහන් කරන්න.

(අ) ....

....

(විකුම්ට විසර්ජනය කරන ලද මුළු ලාභය)

(ආ) විකුම්ගේ ණය ගිණුමට මාරු කළ මුදල රු. ....

39. මූල්‍ය වාර්තාකරනයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සඳහා භාවිත කල හැකි ප්‍රධාන පදනම් දෙක සඳහන් කරන්න.

(i) ....

(ii) ....

40. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සමාගමකට අදාළ වේ.

- 2021.04.01 දින රු.500,000ක මූලික තැම්පතුවක් ගෙවා රු.2,000,000ක මෝටර් රථයක් කල්බදු ක්‍රමයට මිලදී ගැනීම.
- 2022.03.31 දින රු.200,000ක පොලී සමග රු.700,000ක කල්බදු වාරිකය ගෙවීම.

ඉහත කරුණු තුළින් පැන නැගුණු මුදල් ප්‍රවාහයන් (වටිනාකම් සහිතව) සහ LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතියට අනුව මෙම මුදල් ප්‍රවාහයන්ගේ නිසි වර්ගීකරණයන් සඳහන් කරන්න. (අනුපිළිවෙලට)

මුදල් ප්‍රවාහය (වටිනාකම සමඟ)	වර්ගීකරණය
A	....
B	....
C	....

41. LKAS 2(තොග) ප්‍රමිතියට අනුව තොගය වියදමක් ලෙස හඳුනාගන්නා අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(i) ....

(ii) ....

42. 2021.09.15 දින සීමිත බෝතේජු සමාගම යන්ත්‍රයක් විකිණීමට සහ ඊට අදාළ අනෙකුත් සේවාවන් සැපයීම සඳහා තම ගණුදෙනුකරුවන් සමග රු.1,800,000ක ප්‍රතිෂ්ඨාවක් යටතේ ගිවිසුමකට එළඹ, එදිනම එම මුදල එකවර ලබාගනී. ගිවිසුමේ ඇතුලත් කොන්දේසි හා ඊට අදාල වටිනාකම් පහත පරිදි වේ.

යන්ත්‍රය ලබා ගැනීම	රු. 1,350,000
ප්‍රවාහනය කර ස්ථාපනය කිරීම	රු. 150,000
මාස හයකට එක බැගින් නඩත්තු සේවා මුර දෙකක් සඳහා	රු. 300,000
	රු. 1,800,000

2021.10.01 දින යන්ත්‍රය සවිකර අවසන් කර එදින සිට නිෂ්පාදන කටයුතු සිදුකරන ලදී. 2022.03.31 දින පළමු නඩත්තු සේවාව ලබා දී ඇත. SLFRS 15 (ගණුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ඇතිවන අයභාරය) ප්‍රමිතියට අනුව මෙම ගිවිසුම සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් අයභාරය රු. ....

(ආ) 2022.03.31 දිනට නොඉපයූ අයභාරය රු. ....

43. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව සඳහන් කරන්න.

	ප්‍රකාශය	සත්‍ය/ අසත්‍ය
A	ආයතනයක ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීම සෑම විටම කළමණාකරුවන්ගේ අභිමතය පරිදි සිදු වේ.	....
B	ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කරනු ලබනුයේ අදාළ අවස්ථාවේදී පවත්නා විශ්වාසනීය තොරතුරු මත පදනම්වයි.	....
C	ප්‍රතිපාදනයක් යනු කාලය හා වටිනාකම අවිනිශ්චිත වගකීමකි.	....
D	අසම්භාව්‍ය වගකීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා නොගනී.	....

44. 2022.03.31 දිනට සමාගමක ක්ෂණික වත්කම් අනුපාතය 2.5:1 ක් පැවතුණි. එදිනට ජංගම වගකීම් රු.120,000ක් හා අවසන් තොගය රු.60,000ක් විය. පහත දෑ හඳුනාගන්න

(අ) 2022.03.31 දිනට ද්‍රවශීල වත්කම්වල වටිනාකම : රු. ....

(ආ) 2022.03.31 දිනට ජංගම අනුපාතය : රු. ....

45. ආයතනයක භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයට අදාලව පහත තොරතුරු දී ඇත.

	උපරිම	අවම
පාරිභෝගිකය (ඒකක)	1200	400
පොරොත්තු කාලය (සති)	6	3

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණද? : ඒකක ....

- **අංක 46 හා 47 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

2022 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා සීමිත මිලාන් පොදු සමාගමේ වැටුප් ලේඛණයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	2022 මාර්තු (රු'000')	2022 පෙබරවාරි (රු.'000')
මූලික වැටුප	9,600	8,000
අතිකාල දීමනා	400	200
සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකය		
සේවකයා (10%)	960	800
සේව්‍යයා (15%)	1,440	1,200
සේවක භාරකාර අරමුදල (ETF) දායකත්වය (3%)	288	240
අඩුකිරීම් : වෘත්තිය සමිති දායක මුදල	180	160

අතිරේක තොරතුරු :

සෑම මසකම වැටුප EPF හා ETF දායකයන් ඊළඟ මාසයේ 10 වන දින ගෙවනු ලබයි.

46. මිලාන් පොදු සමාගමේ 2022 මාර්තු මාසය සඳහා පහත දෑ සඳහන් කරන්න.

(අ) සේවකයන්ට අදාළ වැටුප් සම්බන්ධ මුළු වියදම: රු. ....

(ආ) සේවකයන්ගේ දළ වැටුප ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන

....

....

47. පහත සඳහන් දෑ ගණනය කරන්න.
   (අ) 2022.03.31 දිනට ගෙවිය යුතු වැටුප් ගිණුමේ ශේෂය : රු. ....
   (ආ) 2022.03.31 දිනට EPF වගකීම: රු. ....

48. සමාගමක එකලස් හා නිමවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් යටතේ භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිතය. එකලස් දෙපාර්තුමේන්තුව යන්ත්‍ර පැය පදනමද නිමවුම් දෙපාර්තමේන්තුව ඍජු ශ්‍රම පැය පදනම මතද පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය කරනු ලැබේ. එකලස් හා නිමවුම් දෙපාර්තමේන්තු වල අයවැය පිළිවෙලින් රු 108,000ක් හා රු 240,000ක් විය. අයවැය ගත නිෂ්පාදන ඒකක ප්‍රමාණය 1000කි. භාණ්ඩ ඒකකයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

   ප්‍රාථමික පිරිවැය රු. 412

   ඒකකයන් සඳහා අවශ්‍ය පැය :

යන්ත්‍ර	පැය 4
ඍජු ශ්‍රම	පැය 6

   පහත දෑ ගණනය කරන්න.
   (අ) පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත (එක් එක් නිෂ්පාදන දෙපාර්තුමේන්තුවල)
   එකලස් : රු. .... නිමවුම් : රු. ....
   (ආ) භාණ්ඩ ඒකකය නිෂ්පාදන පිරිවැය : රු. ....

49. සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලබන තනි භාණ්ඩයක් සම්බන්ධ අයවැය ගත ආදායම් සහ පිරිවැය දත්ත පහත දී ඇත.

   විකුණුම් පරිමාව ඒකක 20000,ඒකක විකුණුම් මිල රු.25/-

   දායක විකුණුම් අනුපාතය 40%, ස්ථාවර පිරිවැය රු.120,000

   පහත දෑ ගනනය කරන්න.

   (ආ) සමච්ඡේදන ලක්ෂය (ඒකක) : ....
   (ආ) අයවැය ගත විකුණුම් පරිමාවේදී ලාභය : ....

50. කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සාමාගමක් සලකා බලමින් සිටි. යන්ත්‍රයට අදාල ඇස්තමේන්තුගත තොරතුරු පහත පරිදි වේ.

යන්ත්‍රයේ ගැනුම් මිල	රු.4,500,000
ස්ථාපනය කිරීමේ පිරිවැය	රු. 500,000
සුන්බුන් අගය	රු.1,000,000
ඵලදායි ජීවකාලය	වසර 5

   තවද ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කිරීම හේතුවෙන් සෑම වසරකම රු.1,600,000ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් ගලා ඒමට අපේක්ෂිතය.

   පහත දෑ ගණනය කරන්න.
   (අ) සාමාන්‍ය වාර්ෂික ලාභය : රු. ....
   (ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය : රු. ....
   (සාමාන්‍ය ආයෝජනය මත)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

ගිණුම්කරණය - II

33 S II

කාලය: පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා, ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්,යොදා ගන්න.

විභාග අංකය: ....

01. සීමිත ආසිරි පොදු සමාගමේ 2022.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

විස්තරය	හර '000'	බැර '000'
දේපල, පිරියත සහ උපකරණ :		
යන්ත්‍රෝපකරණ - අගය	6,500	
මෝටර් රථ - පිරිවැයට	15,000	
කාර්යාල උපකරණ - පිරිවැයට	4,500	
2021.04.01 දිනට සමුච්චිත ක්ෂය :		
යන්ත්‍රෝපකරණ		1,300
මොටර් රථ		4,500
කාර්යාල උපකරණ		1,800
විකුණුම්		32,000
විකුණුම් පිරිවැය	10,500	
වෙළඳ ලැබිය යුතු දෑ	10,800	
වෙළඳ ගෙවිය යුතු දෑ		4,050
2022.03.31 දිනට තොගය	1,500	
මුදල් හා මුදල් සමාන දෑ	800	
ගෙවූ ලාභාංශ	1,000	
2021.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය		750
ප්‍රකාශිත ප්‍රාග්ධන - සාමාන්‍ය කොටස්		18,000
2021.04.01 දිනට යන්ත්‍ර ප්‍රත්‍යාගණන සංචිතය		800
2021.04.01 දිනට රඳවා ගත් ඉපැයුම්		3,750
බෙදා හැරීමේ පිරිවැය	4,800	
පරිපාලන වියදම්	4,500	
වෙනත් වියදම්	4,750	
මූල්‍ය පිරිවැය	1,200	
ගෙවූ ආදායම් බදු (2021/2022)	1,100	
	66,950	66,950

අතිරේක තොරතුරු :

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම කළ යුතු වේ.

(i) කුලියට ගත් ගොඩනැගිල්ලක සමාගම පවත්වාගෙන යනු ලබන අතර එහි වාර්ෂික කුලිය රු.240,000ක් වන අතර ඒ සඳහා ගෙවන ලද කුලිය රු.360,000ක් පරිපාලන වියදම් තුළ ඇතුලත් වේ.

(ii) 2021.04.01 දින යන්ත්‍රෝපකරණ නැවත රු.4,600,000කට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, පෙර වර්ෂයක යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද අතිරික්තය ප්‍රත්‍යාගණනය සංචිතයෙන් නිරූපනය වේ. යන්ත්‍රෝපකරණවල ඉතිරි ඵලදායී ජීවකාලය වර්ෂ 4ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර සුන්බුන් අගයක් නොමැත. මීට අදාල කිසිදු ගිණුම් සටහනක් තබා නැත.

(iii) 2021.10.01 දින කාර්යාල උපකරණ වලින් කොටසක් රු.2,000,000කට විකුණන ලදී. ඒවා 2019.10.01 දින රු.2,500,000ට මිලදී ගෙන තිබූ අතර සමාගම විසින් කාර්යාල උපකරණ පිරිවැය මත 20%ක් බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. කාර්යාල උපකරණ විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුමට ''හර'' කර විකුණුම් ගිණුමට ''බැර'' කර ඇත. මීට අදාළව වෙනත් කිසිදු සටහනක් තබා නැත.

(iv) පැවති මෝටර් රථ සියල්ල භාණ්ඩ බෙදා හැරීම සඳහා භාවිත කරනු ලැබේ. එම මෝටර් රථ සඳහා වාර්ෂික ක්ෂය රු.1,500,000කි. මෙම වටිනාකම වැරදීමකින් පරිපාලන වියදම් තුළ ඇතලත් කර මෝටර් රථ ගිණුමට බැර කර ඇත.

(v) අධ්‍යක්ෂකවරුන්ට ගෙවන ලද ඉන්ධන දීමනාව රු.200,000/-ක්ද විගණන ගාස්තු ලෙස ගෙවන ලද රු.300,000 ක්ද පරිපාලන වියදම් තුළ ඇතුලත් වේ. විගණන ගාස්තු රු.50,000ක් උපචිතව ඇත.

(vi) 2021.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුණු අතර වසර 5ක කාලයක් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රයෝජනය පිණිස මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. එදින මූලික ගෙවීම් ලෙස රු2,900,000 ක්ද සෘජු වියදම් ලෙස රු.80,000 ක්ද ගෙවන ලදී. එහි ඵලදායී ජීව කාලය වසර 5කි. සුන්බුන් අගය රු.710,000කි. 2022.03.31 දින ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු.625,000ක් ගෙවන ලදී. මූලික මිනුම් කිරීමේදී කල්බදු වගකීම රු.1,730,000 ක් විය. ප්‍රවර්තන වර්ෂය හා ඊළඟ වර්ෂය සඳහා කල්බදු පොලිය පිළිවෙලින් රු.173,000 හා රු.128,000ක් වේ. සමාගම විසින් ගෙවනු ලැබූ මූලික ගෙවීම, සෘජු වියදම් හා ප්‍රථම කල්බදු වාරිකය පමණක් වෙනත් වියදම් තුළ සටහන් කර තිබුණි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහන් තබා නැත. ඉදිරි වාර්ෂික වාරිකයද සමාන අගයකි.

(vii) පෙර වර්ෂය ආදයම් බදු වලින් නිදහස් කාලච්ඡේදයක් වූ අතර ගෙවූ ආදායම් බදු වලින් නිරූපනය වන්නේ ප්‍රවර්තන වර්ෂයේ මුල් කාර්තු තුන (3) සඳහා ගෙවූ ආදායම් බදු වේ. 2021/ 2022 කාලච්ඡේදයේ අවසාන කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බදු රු.400,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2022.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු.640,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ix) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් 2022.05.15 දින අනුමැතිය ලබා දුන් අතර පහත සිදුවීම් මෙම දිනට පෙර සිදු වී ඇත.

- සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙකු සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.03.31 දින සමාගමේ නීතීඥයින්ගෙන් මේ පිළිබඳ විමසීමක් කරන ලද අතර ඔහුගේ මතයට අනුව රු.450,000ක වන්දියක් ගෙවීමට සිදුවන බව විශ්වාසනීය ප්‍රකාශය කරන ලදී.
- 2022.03.31 දිනට තොගයේ පිරිවැය රු.1,500,000ක් වූ අතර ඒවායෙහි ශුද්ධ උපලබ්ධි අගය රු.1,800,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2022.05.01 දින මෙම තොගය රු.1,600,000කට විකුණන ලදී.
- 2022.04.10 දින ණයට විකුණුම් සම්බන්ධ රු.400,000ක ණය ගැතියෙකු බුන්වත් බව උසාවිය මගින් 2022.05.05 දින තීන්දුව ලබා දෙන ලදී.

අවශ්‍ය වන්නේ,

LKAS -1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ආසිරි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ඇතුළුව) ඃ

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.
2. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
3. 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40)**

02. (අ) සීමිත නඳුන් පොදු සමාගම නිෂ්පාදනය කරන භාණ්ඩයක් සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය අයිතමයක් සම්බන්ධ තොරතුරු 2022 අප්‍රේල් මාසය සඳහා පහත දැක්වේ.

දිනය	විස්තරය	ප්‍රමාණය (ඒකක)	ඒකක පිරිවැය (රු.)
අප්‍රේල් 01	ආරම්භක ශේෂය	1000	40
අප්‍රේල් 06	මිලදී ගැනුම්	3000	48
අප්‍රේල් 11	කම්හලට නිකුත් කිරීම්	2000	?
අප්‍රේල් 17	මිලදී ගැනුම්	4000	50
අප්‍රේල් 20	කම්හලට නිකුත් කිරීම්	4000	?
අප්‍රේල් 25	මිලදී ගැනුම්	3000	52
අප්‍රේල් 30	කම්හලට නිකුත් කිරීම්	3500	?

අවශ්‍ය වන්නේ,

1. පෙර - පිවිසි පෙර - සිට (FIFO) ක්‍රමයට අනුව 2022.04.30 දිනට ගබඩා සටහන් පත්‍රිකාව (ගබඩා ලෙජරය.)
2. පෙර - පිවිසි පෙර සිට (FIFO) ක්‍රමයට නිෂ්පාදනය සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය පිරිවැය
3. හරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට 2022.04.30 දිනට ඉතිරි තොගය

(ල 15)

(ආ) සීමිත කල්පණී පොදු සමාගම අත්බෑග් නිෂ්පාදනය කරනු ලබයි. ''කැපීමේ අංශය'' හා ''මැසීමේ අංශය'' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ද ''ගබඩාව'' නමින් සේවා දෙපාර්තමේන්තුවක් සහිතව එකම ගොඩනැගිල්ලක මෙම සියලු දෙපාර්තමේන්තු පවත්වාගෙන යනු ලබයි. උපරිම ක්‍රියාකාරී මට්ටමේදී ඊළඟ වර්ෂය සඳහා අයවැයගත පොදු කාර්ය පිරිවැය පහත පරිදි වේ.

ඇස්තමේන්තුගත පොදු කාර්යය පිරිවැය	රුපියල්
කුලී හා වරිපනම්	105,000
වක්‍ර වැටුප්	1,100,000
යන්ත්‍ර ක්ෂය	110,000
විදුලිය ආලෝක කිරීම	315,000
යන්ත්‍ර ක්‍රියා කිරීමට බලය	525,000
සේවක අධීක්ෂණ වියදම්	220,000

අනෙකුත් තොරතුරු

(i)

	කැපීමේ අංශය	මැසීමේ අංශය	ගබඩාව
යන්ත්‍ර වටිනාකම(රු'000)	4,200	2,400	-
භාවිතයට බෙදාගන්නා බිම් ප්‍රමාණය	500	500	50
සේවක සංඛ්‍යාව	5	5	1
යන්ත්‍ර ධාවන පැය	10000	7500	-

(ii) ගබඩා අංශයේ පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන අංශවලට විභජනය කරනුයේ යන්ත්‍ර ධාවන පැය පදනම අනුවය

(iii) එක් අත් බෑගයක් නිපදවීම සඳහා සෘජු ශ්‍රම පිරිවැය හා සෘජු ද්‍රව්‍ය පිරිවැය පිළිවෙලින් රු.500 ක් හා රු.1,500ක් වේ

(iv) එක් අත්බෑගයක් නිපදවීම සඳහා කැපීමේ අංශයෙන් යන්ත්‍ර පැය 2ක්ද මැසීමේ අංශයෙන් යන්ත්‍ර පැය 3ක්ද වශයෙන් කාලය ගත වේ.

අවශ්‍ය වන්නේ,

1. විභාජන පදනම් පැහැදිලිව දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ද්විතියික විභාජනයද ඇතුළුව)
2. කැපීමේ අංශය හා මැසීමේ අංශය යන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්ර්ග්‍රහණ අනුපාත.
3. අත්බෑගයක නිෂ්පාදන පිරිවැය.
4. විකුණුම් මිල මත 20%ක ලාභ ආන්තිකයක් පවත්වා ගන්නේ නම් අත්බෑග් 2000ක් විකිණීමෙන් ලැබෙන දළ ලාභය (ල 25)

(මුළු ලකුණු 40)

03. 2022.04.01 දින අමල් කාබනික කෘෂි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා 'හරිත' ට්‍රේඩර්ස් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී . 2022 අප්‍රේල් මාසය තුළදී සිදු වූ ව්‍යාපාරයේ සමහර ගණුදෙනු ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පහත පරිදි සටහන් කර ඇත.

රු'000

ගණුදෙනු අංකය	වත්කම්				වගකීම්			
	දේපළ පිරියත හා උපකරණ	තොග	වෙළඳ ලැබිය යුතු දෑ	මුදල්	වෙළඳ ගෙවිය යුතු දෑ	උපචිත වියදම්	දිගුකාළීන ණය	හිමිකම
1	+2,000			+1,500				+3,500
2		+1,400		-600	+800			
3				+400			+400	
4		-900	+1,200					+300
5		-50			-50			
6				-540	-600			+60
7		+100	-130					-30
8			-800	+720				-80
9		-20						-20
10				-25		+5		-30
11			-50		-50			
12			-10					-10
13		-200		+250				+50
14				-22			-20	-2
15	-20							-20
එකතුව	1,980	330	210	1,683	100	5	380	3,718

අතිරේක තොරතුරු

(i) ව්‍යාපාරයේ සියලුම මුදල් ගණුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලැබේ. (භාණ්ඩ ගැනිලිකර නැත.)

(ii) 2022.04.30 දිනට ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකග නොවීය. පසුව කරන ලද විමර්ෂණයේදී පහත දෑ පොත්වල සටහන් කර නොමැති බව අනාවරණය විය.

- ණයගැතියෙකු විසින් බැංකුවේ සෘජුවම තැම්පත් කරන ලද චෙක්පත රු.60,000කි.
- අමල්ගේ නිවසේ භාවිත කරන මෝටර් රථය සඳහා ගෙවනු ලැබූ කල්බදු වාරිකය සඳහා වූ රු.20,000ක චෙක්පතක්, එහි අඩංගු කල්බදු පොලිය රු.5,000කි.
- ව්‍යාපාරයේ විදුලිගාස්තු සඳහා ස්ථාවර නියෝග ගෙවීම් රු.8,000කි.
- බැංකුව අය කළ බැංකු ගාස්තු රු.2,000

(iii) 2022 අප්‍රේල් මාසය සඳහා ප්‍රාදේශීය සභාවට, ගෙවිය යුතු වරිපනම් ගාස්තු රු.4,000කි.

අවශ්‍ය වන්නේ,

1. ගණුදෙනු අංක 1 සිට 15 දක්වා විස්තර කිරීම (වටිනාකම සමඟ) (ල 30)
2. 2022.04.30 දිනට මුදල් පාලන ගිණුමේ සංශෝදිත ශේෂය (ල 05)
3. ශුද්ධ වත්කම් පදනම මත 2022 අප්‍රේල් මාසයේ ලාභය හෝ අලාභය (ල 05)

(මුළු ලකුණු 40)

04. (අ) සීමිත අස්වින් පොදු සමාගම ජංගම දුරකථන හා උපාංග අලෙවිකරණය VAT සඳහා ලියාපදිංචි වෙළඳ ව්‍යාපාරයකි. සමාගම භාණ්ඩ මිලදී ගැනීම හා විකිණීම අත්පිට මුදලට මෙන්ම ණයටද සිදු කරනු ලබයි. 2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු ණයගැති හා ණයහිමි උපලේජරන්ගෙන් උපුටාගන්නා ලදී.

2022.03.31 දිනට ණයගැති උපලෙජරය (රු'000)

නම	ආරම්භක ශේෂය	විකුණුම්	මුදල් ලැබීම්	දුන් වට්ටම්	අවසාන ශේෂය
ග්ලෝබල් ට්‍රේඩර්ස්	200	800	630	70	300
යුනිවර්සල් ට්‍රේඩර්ස්	150	600	450	50	250
බීටා ට්‍රේඩර්ස්	250	700	540	60	350
එකතුව	600	2100	1620	180	900

2022.03.31 දිනට ණයහිමි උපලෙජරය (රු'000)

නම	ආරම්භක ශේෂය	ගැණුම්	මුදල් ලැබීම්	ලද වට්ටම්	අවසාන ශේෂය
ගැමා ට්‍රේඩර්ස්	100	400	225	25	250
ඇල්ෆා ට්‍රේඩර්ස්	-	500	360	40	100
යුනික් ට්‍රේඩර්ස්	150	300	150	-	300
එකතුව	250	1200	735	65	650

2022.03.01 ණයගැති හා ණයහිමි උප ලෙජර ශේෂ ලැයිස්තුව එකතුවට අදාල පාලන ගිණුම්වල එදිනට වූ ශේෂ සමග සමාන විය. 2022.03.01 දින මුදල් පාලන ගිණුමේ ශේෂය රු.80,000ක් විය. ණයගැති ලැබීම් හා ණයහිමි ගෙවීම් වලට අමතරව පහත මුදල් ගණුදෙනු 2022 මාර්තු මාසය තුළදී සිදුවිය.

- අත්පිට විකුණුම් හා අත්පිට ගැනුම් පිළිවෙලින් රු.1,200,000ක් රු.750,000ක් විය.
- සියලුම ගැනුම් හා විකුණුම් වටිනාකම් දක්වා ඇත්තේ 10%ක VAT රහිතව වන අතර මාර්තු මාසය තුළ ගෙවූ VAT රු.60,000කි.
- මාසය තුළ මෙහෙයුම් වියදම් සඳහා රු.150,000ක් ගෙවන ලදී.
- මාසය තුළ පැරණි කාර්යාල උපකරණ විකිණීමෙන් ලද මුදල රු.230,000කි.
- ආයෝජන ආදායම් ලැබීම් රු.200,000

(ගණුදෙනුවල දිනයන් නොසලකා හරින්න)

අවශ්‍ය වන්නේ,

1. (i) මුදල් ලැබීම් ජර්නලය (ii) මුදල් ගෙවීම් ජර්නලය (iii) විකුණුම් ජර්නලය
   (iv) ගැනුම් ජර්නලය
2. 2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්
   (i) මුදල් පාලන ගිණුම (ii) ණයගැති පාලන ගිණුම
   (iii) ණයහිමි පාලන ගිණුම (iv) VAT පාලන ගිණුම
3. ණයහිමි උපලෙජරයේ ණයහිමි පෞද්ගලික ගිණුම් හා ණයහිමි ශේෂ ලැයිස්තුව (ල 30)

(ආ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මල්කි පොදු සමාගමේ පහත තොරතුරු සපයා ඇත.

විස්තරය	රු'000
විකුණුම්	28,000
දළ ලාභය	11,200
2021.04.01 දිනට තොගය	3,200
2022.03.31 දිනට තොගය	2,400
මෙහෙයුම් වියදම් (පොලී වියදම ඇතුළුව)	4,800
පොලී වියදම	1,280
බදු වියදම	1,600

අතිරේක තොරතුරු,

(i) 2022.03.31 දින ව්‍යාපාරයේ මුළු වත්කම් හා වගකීම් පිළවෙළින් රු.20,000,000ක් රු. 50,000,000ක් විය.

(ii) 2022.03.31 දිනට නිකුත් කර තිබූ කොටස් ගණන 1,600,000කි.

(iii) මුළුවත්කම්වලින් 20%ක් ජංගම වත්කම් වන අතර මුළු වගකීම්වලින් 25%ක් ජංගම වගකීම් වේ.

අවශ්‍ය වන්නේ,

1. ක්ෂණික වත්කම් අනුපාතය 2. පොලී ආවරණ අනුපාතය 3. ශුද්ධ ලාභ අනුපාතය
4. තොග පිරිවැටුම් අනුපාතය 5. කොටසක ඉපයුම (ල. 10)

(මුළු ලකුණු 40)

05. (අ) ලාභාලාභ සම සමව බෙදාගන්නා රංග හා සුරංග හවුල් ව්‍යාපාරය රංගට අයිති ගොඩනැගිල්ලක වාර්ෂික කුලී පදනමට පවත්වා ගෙන යති. 2021.04.01 දින විරංග නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීම හේතුවෙන් සංශෝධනය කරන ලද හවුල් ගිවිසුම පහත පරිදි වේ.

- රංග, සුරංග හා විරංග පිළිවෙලින් 2:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීම.
- සෑම හවුල්කරුවෙකුටම ගලපන ලද ප්‍රාග්ධන ශේෂ මත 10%ක වාර්ෂික පොලියක් ගෙවීම.
- සුරංගට හා විරංගට රු.30,000 බැගින් මාසික වේතනයක් ගෙවීම.
- ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීම.

- කීර්තිනාමය හැර හවුල්රුවන් සමග සිදුකරන අනෙකුත් සියළුම ගණුදෙනු ඔවුන්ගේ ජංගම ගිණුම මගින් සටහන් කිරීම.

2022.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරදි වේ.

විස්තරය	හර (රු.'000)	බැර(රු'000)
ප්‍රාග්ධන ගිණුම් 2021.04.01 දිනට		
රංග		3,000
සුරංග		2,000
ජංගම ගිණුම් 2021.04.01 දිනට		
රංග		400
සුරංග		300
ණය ගිණුම රංග 2021.04.01 දිනට		100
දේපල පිරියත උපකරණ (ධාරණ අගයට)	8000	
විකුණුම්		5,450
විකුණුම් පිරිවැය	3,000	
මෙහෙයුම් වියදම්	630	
2022.03.31ට තොගය	350	
මුදල්	270	
රංග ගෙනා මෝටර් රථයේ පිරිවැය		1,000
එකතුව	12,250	12,250

අතිරික්ත තොරතුරු,

(i) ගැණුම්කරු ඉවත්කර නොගත් පිරිවැය රු.55,000ක්වූ තොග 2022.03.31 තොගයේ ඇතුළත් වේ. විකුණුම් පිරිවැය සෙවීමේදී මෙය සැලකිල්ලට ගෙන නැත.

(ii) රු.360,000ක් වූ වාර්ෂික ගොඩනැගිලි කුලිය 2022.01.01 සිට රු.480,000ක් දක්වා වැඩි කිරීමට රංග සමග එකගව ඇතත් කුලී සම්බන්ධ කිසිදු ගිණුම් තැබීමක් සිදුකර නොමැත

(iii) රංගගේ හා සුරංගගේ රු.5,000 බැගින් වූ පෞද්ගලික ජීවිත රක්ෂණ ඔප්පු වාරික මුදලක් ගෙවීම හා සුරංගට මාස 6ක් හා වීරංග මාස 9ක් සඳහා ගෙවූ වේතන ගෙවීම මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් වේ.

(iv) 2021.04.01 දින හවුල් ව්‍යාපාරයට බඳවාගත් විරංග තම ප්‍රාග්ධනය හා කීර්තිනාම කොටස වෙනුවෙන් රු.1,000,000ක් වටිනා මෝටර් රථය ව්‍යාපාරයට පවරා දෙන ලදී. මෙදින කීර්තිනාමයට රු.500,000ක් ලෙස තක්සේරු කරන ලදී.

(v) විරංග පවරා දුන් මෝටර් රථය 2021.04.01 දිනෙන් ආරම්භ වන වර්ෂය සඳහා වාහන බලපත්‍ර අළුත් ගාස්තු රු.10,000ක් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන විසර්ජනයන් ද සහිතව)
2. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් (ල. 20)

(ආ) සීමිත නුවන් සමාගමේ 2022.03.31 හා 2021.03.31 දිනට පිළියෙල කල සාරාංශ ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දැක්වේ.

විස්තරය	2022.03.31 දිනට		2021.03.31 දිනට	
	(රු'000)		(රු'000)	
දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගයට)		14,300		15,100
භාවිත අයිතියය ඇති මෝටර් රථ (ධාරණ අගයට)		4,500		
තොගය		5,100		2,100
වෙළඳ ලැබිය යුතු දෑ		4,600		1,400
මුදල් හා මුදල් සමාන දෑ		2,300		1,900
මුළු වත්කම්		30,800		20,500
ප්‍රකාශිත ප්‍රාග්ධන සමාන්‍ය කොටස්		18,000		12,000
ප්‍රත්‍යාගණන සංචිතය		1,500		500
පොදු සංචිතය				500
රඳවාගත් ඉපැයුම්		2,900		2,000
කල්බදු ණයහිමියන්		3,200		
වෙළෙඳ ගෙවිය යුතු දෑ		4,900		5,300
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		300		200
මුළු හිමිකම් හා වත්කම්		30,800		20,500

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරේක තොරතුරු,

(i) වර්ෂය තුළ රු.600,000ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

(ii) 2021.04.01 දින ධාරණ අගය 1,100,000ක් මෝටර් රථයක් රු.1,000,000කට අත්පිට විකුණා එදිනම එම මුදලින් මූලික ගෙවීමක් කර ඉතිරිය සමාන වාර්ෂික වරික 5 කින් ගෙවීමේ පොරොන්දුවට රු.5000,000කට නව මෝටර් රථයක් කල්බදු ක්‍රමයට මිලට ගෙන ඇත. පළමු කල්බදු වාරිකය ගෙවා ඇති අතර, එහි ඇතුලත් පොලිය 10%කි.

(iii) සංචිත ප්‍රාග්ධනිත කිරීමක් සඳහා රඳවාගත් ඉපැයුම් රු1,500,000ක්ද යොදා ගෙන ඇති අතර වර්ෂය තුළ හිමිකම් කොටස් නිකුතුවක් සිදු කර ඇත.

(iv) වර්ෂයේ බදු වියදම කාලච්ඡේදයේ ලාභයෙන් 1/5කි.

අවශ්‍ය වන්නේ,

LKAS - 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතියට අනුව 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිමිත නුවන් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **(ල 20යි)**

(මුළු ලකුණු 40යි.)

06. (අ) කාබනික පොහොර නිපදවන Agro Friendly පොදු සමාගම තම කර්මාන්ත ශාලාව සඳහා විදුලිය නිපදවන නව තාක්ෂණික ආයෝජනය කිරීමට සැලසුම් කරමින් සිටියි. මූලික ශාක්‍යතා අධ්‍යනය සඳහා දැනටමත් රු.400,000ක් වැය කර ඇත.

- නව තාක්ෂණයේ මූලික පිරිවැය - රු.5,000,000
- ස්ථාපිත කිරීමේ පිරිවැය - රු.1,000,000
- කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව සඳහා - රු.600,000
  (ව්‍යාපෘති අවසානයේ කාරක ප්‍රාග්ධනයෙහි කිසිම වටිනාකමක් ආවරණය කරගත නොහැකිය.)

- ආයෝජනයේ ජීව කාලය වසර 5ක් වන අතර එම කාලය අවසානයේදී එහි සුන්බුන් අගය රු.600,000කි.

වර්ෂ 5ක් තුළ මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු පහත පරිදි වේ.

වර්ෂය	1	2	3	4	5
විදුලි වියදම් ඉතිරිය	2,000,000	2,200,000	2,300,000	1,800,000	1,200,000
ක්ෂයවීම් හැර අතිරේක මෙහෙයුම් වියදම්	150,000	250,000	300,000	200,000	400,000

එකිනෙක වර්ෂය සඳහා 10% වට්ටම් අනුපාතය පහත පරිදි වේ.

වර්ෂය	1	2	3	4	5
10% වට්ටවම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍ය වන්නේ,

(1) මෙම ව්‍යාපෘතියේ මුදල් ගලායාම් හා ගලාඒම් ඇතුලත් ලේඛනයක් (මූලික ප්‍රවාහයන් ඇතුළුව)

(2) ආයෝජනයේ පිළිගෙවුම් කාලය

(3) ආයෝජනයේ ශුද්ධ වර්තමාන අගය

(4) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ආයෝජනය තෝරා ගැනීම පිළිබඳ නිර්දේශය

(ල 10)

(ආ) ''එක්සත් සුහද'' සංගමය සමාජ සුභසාධනය සඳහා පිහිටුවා ගත් ලාභ අරමුණුකර තොගයේ සංවිධානයකි. සාමාජිකයින් 80ක් සිටින අතර සාමාජිකයින්ගෙන් වර්ෂයට රු.3,000ක් බැගින් සාමාජික මුදල් ලෙස අයකරනු ලැබේ. 2021.04.01 දිනට මෙම සංගමයේ පහත ගිණුම් ශේෂ දක්නට ලැබුණි. (මුදල් ශේෂය හැර)

උපකරණ	රු.150,000
ලැබිය යුතු සාමාජික මුදල්	රු. 20,000
උපචිත වියදම්	රු .40,000
සමුච්චිත අරමුදල	රු ?

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ගිණුම පහත පරිදි වේ.

මුදල් ගිණුම

		(රු.)	
2021.04.01 ඉ/ගෙ/ශේෂ	20,000	වියදම්	රු.140,000
සාමාජික මුදල් (2020/2021)	15,000		
සාමාජික මුදල් (2021/2022)	225,000	2022.03.31 ප/ගෙ/ශේ	130,000
සාමාජික මුදල් (2022/2023)	10,000		
	270,000		270,000

අතිරේක තොරතුරු,

(i) 2021.04.01 දිනට රු.300,000ක් වටිනා උපකරණ පරිත්‍යාගයක් ලෙස ලැබී ඇත. මෙම උපකරණ වසර 10ක් තුළ ආදායමේ හඳුනාගැනීමට තීරණය කෙරිණි.

(ii) උපකරණ වාර්ෂික 10% බැගින් ක්ෂය කිරීමටත් තීරණය කරන ලදී.

(iii) 2022.03.31 දිනට උපචිත වියදම් රු.25,000කි.

අවශ්‍ය වන්නේ,

(1) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම

(2) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ ඌණනතාව

(3) 2022.03.31 දිනට සමුච්චිත අරමුදල (ල. 10)

(ඉ) සීමිත රසික පොදු සමාගම විදුලි බල්බ නිපදවන ආයතයකි. විශේෂිත වර්ගයක LED බල්බයක් නිපදවීම සඳහා පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

මුළු ස්ථාවර පිරිවැය	රු.3,000,000
බල්බයක විකුණුම් මිල	රු.500
දායක විකුණුම් මිල	40%
අපේක්ෂිත විකුණුම් ධාරිතාව බල්බ	25,000

අවශ්‍ය වන්නේ,

(1) ඒකකය විචල්‍ය පිරිවැය හා ඒකකයක දායකය

(2) සම්ජේදන ලක්ෂණයේ විකුණුම් ඒකක ගණන

(3) ආරක්ෂිත ආන්තතික ඒකක ගණන

(4) අපේක්ෂිත විකුණුම් මට්ටමේදී ලාභය

(5) රු.2,500,000ක ලාභයක් ලැබීමට සිදුකළ යුතු විකුණුම් වටිනාකම

(6) ඊළග වර්ෂයේ සිට දැඩි තරඟ කාරීත්වයක් නිසා බල්බයේ විකුණුම් මිල 20%කින් පහළ දැමීමට සැලසුම් කර ඇති අතර ඒ තුළින් ඒකක 45000ක විකුණුම් ධාරිතාවක් අපේක්ෂා කරයි නම්,

(i) දායක විකුණුම් අනුපාතය

(ii) සමච්ඡේද ලක්ෂ්‍යයේ විකුණුම් වටිනාකම

(iii) අපේක්ෂිත ලාභයෙහි අඩුවීම හෝ වැඩිවීම

(ල 20)

(මුළු ලකුණු 40යි.)